**තිරසාර විදුලිබල අංශ සහාය ව්‍යාපෘතිය - 2014**

------------------------------------------------

තිරසාර විදුලිබල අංශ සහාය ව්‍යාපෘතියේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2011 ජූනි 20 දින එළඹි අංක 2733 එස්ආර්අයි (එස්එෆ්) සහ අංක 2734 - එස්ආර්අයි (එස්එෆ්) දරන ණය ගිවිසුම්වල IV ව්‍යවස්ථාවේ 4.05 (අ) සහ 4.03 (අ) වගන්ති සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු , අරමුදල් යෙදවීම සහ ව්‍යාපෘති කාලය

--------------------------------------------------------------------------------

ව්‍යාපෘතියේ ණය ගිවිසුම් අනුව, විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ 1 සිට 6 කොටස් සහ 9 සිට 10 කොටස් සඳහා ලංකා විදුලිබල මණ්ඩලය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වන අතර 7 සහ 8 කොටස් සඳහා සුනිත්‍ය බලශක්ති අධිකාරිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණු වන්නේ විශ්වාසදායී, ප්‍රමාණවත් සහ දැරිය හැකි විදුලිබල සැපයුම් ආවරණය ව්‍යාප්ත කිරීම හා, (i) නැගෙනහිර, උතුරු මැද, දකුණු හා ඌව පළාත්වල සම්ප්‍රේෂණ පද්ධතිය ශක්තිමත් කිරීම. (ii) නැගෙනහිර හා ඌව පළාත්වල ග්‍රාමීය විදුලි බල සැපයුම පුළුල් කිරීම. (iii) බලශක්ති කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම සහ පුනර්ජනනීය බලශක්තිය තවදුරටත් සංවර්ධනය කිරීම මඟින් සේවා බෙදා හැරීමේදී කාර්යක්ෂමතාවය හා විශ්වාසදායීත්වය වැඩිදියුණු කිරීමයි. ව්‍යාපෘති පරිපාලන අත්පොත අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 18,135 කට සමාන එජඩො මිලියන 162.03 ක් වන අතර ඉන් රු.මිලියන 13,427.64 කට හෝ සියයට 74 කට සමාන එජඩො මිලියන 120 ක් සැපයීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2011 නොවැම්බර් 17 දින ආරම්භ කරන ලද අතර 2014 අප්‍රේල් 30 වන විට නිම කිරීමට නියමිත විය. ණය මුදල 2016 ඔක්තෝබර් 30 දින වසා දැමීමට අපේක්ෂිතය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

----------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම

අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.
මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරිමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) අග්‍රිම අරමුදල් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රීලංමබැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඉ) ණය ගිවිසුම්වල නියම කර ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකිද යන බව.

(ඊ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුම්වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(උ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඌ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(එ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඒ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(ඔ) ණය ගිවිසුම් වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

-----------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2.1 මතය

--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැර, මාගේ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව, 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) අග්‍රිම අරමුදල් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ සහ එම ගිණුමින් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) ණය ගිවිසුම්වල නියම කර ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව සහ,

(ඊ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

-------------------------------------

### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කොන්ත්‍රාත්කරුවන් මඟින් රු.මිලියන 68.68 ක පිරිවැයකට ප්‍රසම්පාදනය කරන ලද මෝටර් වාහන, දේපල, පිරියත හා උපකරණ යටතේ ප්‍රාග්ධනිත කරනු වෙනුවට කෙරී ගෙන යන වැඩ යටතේ දක්වා තිබුණි.

(ආ) ග්‍රාමීය විදුලිබල සැපයුම් හා බෙදාහැරීම් පද්ධති වැඩිදියුණු කිරීම පිළිබඳ සංරචකය යටතේ ආනයනය කරන ලද ලොරි රථ 03 ක් මත ව්‍යාපෘතිය වෙනුවෙන් විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය විසින් 2013 වර්ෂයේදී ගෙවන ලද රු.මිලියන 12.56 ක රේගු ගාස්තු දේපල, පිරියත හා උපකරණ යටතේ ප්‍රාග්ධනීත කර නොතිබුණි.

### 2.2.2 නොසැසඳූ ශේෂ

2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන පිළිවෙලින් අංක 2733 හා අංක 2734 දරන ණය ගිවිසුම් යටතේ සමාලෝචිත වර්ෂය තුළ වියපැහැදම් කරන ලද රු.මිලියන 7,531 ක් හා රු.මිලියන 678.92 ක් වූ ණය මුදල්, මුදල් අමාත්‍යාංශයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලැබූ වාර්තාවල දැක්වෙන රු.මිලියන 7,607 ක් හා රු.මිලියන 877.62 ක් වූ අනුරූපී මුදල් සමඟ එකඟ නොවන බව නිරීක්ෂණය විය. මෙම වෙනස්කම් සැසඳීමට පියවර ගෙන නොතිබුණි.

### 2.2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) 2014 මාර්තු 31 ට හෝ ඊට පෙර විගණකාධිපතිවරයාට ඉදිරිපත් කළ යුතු ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන 2015 ජූලි 02 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

(ආ) ණය ගිවිසුම්වල 1.10 වගන්තියට පටහැනිව කොන්ත්‍රාත්කරු විසින් ගෙවන ලද රු.මිලියන 8.93 ක් වූ ආදායම් බදු ප්‍රතිපූර්ණය කිරීම සඳහා ව්‍යාපෘතිය කටයුතු කර තිබුණි.

## 3. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය හා සමාලෝචිත වර්ෂය තුළ හා 2014 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම්වල මූල්‍යයනය කිරීම සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරීම | උපයෝජනය කළ අරමුදල් සමාලෝචිත වර්ෂය තුළ | | උපයෝජනය කළ අරමුදල් 2014 දෙසැම්බර් 31 දින දක්වා | |
|---|---|---|---|---|---|---|---|
| | එජඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන |
| ආසබැ | 120.0 | 13,427.64 | 4,307.00 | 45.00 | 4,141.00 | 69.00 | 8,210.00 |
| ශ්‍රී ලං ර | 42.03 | 4,707.36 | 13.00 | - | - | - | - |
| ලං වි ම | - | - | 429.00 | - | 259.00 | - | 1,386.00 |
| | 162.03 | 18,135.00 | 4,749.00 | 45.00 | 4,400.00 | 69.00 | 9,596.00 |

## 3.2 භෞතික කාර්යසාධනය

-------------------------

ලබා ගත හැකි වූ තොරතුරු අනුව, ව්‍යාපෘතියේ නව ගාල්ල විදුලිබල සම්ප්‍රේෂණ සංවර්ධන සංරචකය යටතේ ගාල්ල ග්‍රිඩ් උපපොළ ඉදිකිරීම හා අම්බලන්ගොඩ සිට ගාල්ල දක්වා සම්ප්‍රේෂණ රැහැන ඉදිකිරීම් පිළිබඳව 2014 දෙසැම්බර් 31 දිනට සියයට 75 ඉක්මවා භෞතික ප්‍රගතියක් දක්වා තිබුණි. කෙසේ වුවද උතුරු නැගෙනහිර විදුලිබල සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘතිය යටතේ කිරිබත්කුඹුර ග්‍රිඩ් උපපොළ වැඩිදියුණු කිරීමේ කටයුතු හා ඌව පළාතේ බෙදාහැරීමේ පද්ධතිය ශක්තිමත් කිරීම යටතේ හල්දුම්මුල්ල හා රාගල මධ්‍යම වොල්ටීයතා බෙදාහැරීම් පද්ධතිය සවිකිරීමේ කටයුතු 2014 දෙසැම්බර් 31 දිනට මන්දගාමී ප්‍රගතියක් දක්වා තිබුණි. තවද " රිඇක්ටිව් පවර් මැනේජ්මන්ට් " (Reactive Power Management) සංරචකය යටතේ අනියකන්ද, අම්බලන්ගොඩ හා කටුනායක ග්‍රිඩ් උපපොළෙහි පාඩු අවම කිරීම සඳහා "MV breaker switched capacitor banks" සවිකිරීම සඳහා ප්‍රසම්පාදනයන් සමාලෝචිත වර්ෂය තුළ සම්පූර්ණ කර නොතිබුණි. ඊට අමතරව, නැගෙනහිර පළාතේ බෙදාහැරීම් ධාරිතා සංවර්ධනය පිළිබඳ සංරචකය යටතේ සපයන ලද මෝටර් වාහන 03 ක් ව්‍යාපෘතිය විසින් පසුව ප්‍රතික්ෂේප කර තිබූ අතර එම වාහන පිරිවිතරයන් සමඟ ගැලපී නොතිබුණි.

## 3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

ලංකා විදුලිබල මණ්ඩලය භාරගන්නා ලද සියලු විදේශ මූල්‍යයන ව්‍යාපෘති සඳහා වගකීම් දරන ලංකා විදුලිබල මණ්ඩලයේ අතිරේක සාමාන්‍යාධිකාරීගේ (ව්‍යාපෘති) විෂය පථය යටතට ව්‍යාපෘතියේ 7 සහ 8 කොටස්වල කාර්යයන් අයත් නොවේ. එබැවින් ලංකා විදුලිබල මණ්ඩලයට පවරන ලද කොටස් 8 ක කාර්යයන් පිළිබඳ සමස්ත නියාමනය විධිමත්ව සිදුකර නොතිබුණි.

## 3.4 ආර්ථික නොවන ගනුදෙනු

----------------------------

ආනයනය කරන ලද මෝටර් වාහන සඳහා රු.මිලියන 2.05 ක් වූ අත්තිකාරමෙන් සියයට 10 ක් හා රු.මිලියන 8.19 ක් වූ රේගු ගාස්තු කොන්ත්‍රාත්කරුවන්ගෙන් අයකර ගැනීමට ව්‍යාපෘතිය විසින් කටයුතු කර නොතිබූ අතර ඒවා පිරිවිතරයන්ට අනුකූල නොවූ බැවින් පසුව ප්‍රතික්ෂේප කර තිබුණි.